# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

## පරිසර පද්ධති සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය (ESCAMP)

**IFB අංකය : LK-ESCAMP-PMU-144716-CW-RFB**

**නව පරිපාලන කාර්ය මණ්ඩල නවාතැන් (ගොඩනැගිලි 3 ක්), ක්‍රීඩාපිටිය සහ මාර්ග ජාලය ඉදිකිරීම (ශ්‍රී ලංකා වන විද්‍යායතනය) SLFI නුවරඑළිය - (P5)**

**IFB අංකය : LK-ESCAMP-PMU-144720-CW-RFB**

**(ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ) SLFI - නුවරඑළියේ නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩල නවාතැන් සහ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීම - (P6)**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියේ පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර එයින් කොටසක් ශ්‍රී ලංකාවේ නුවරඑළියේ ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

2. පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයේ පරිසර පද්ධති සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ (PPC) සභාපති විසින් පහත වගුවේ සඳහන් පරිදි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා නුවරඑළිය - ශ්‍රී ලංකා වන විද්‍යායතන යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

   ඉදිකිරීම් කාලය දළ වශයෙන් දින 300 (මාස 10ක්)

| ලංසු අංකය | ලංසුවේ නම | කර්මාන්තයේ විෂය පථය | VAT බදු සහ අනිශ්චිත වියදම් හැර ඉංජිනේරු ඇස්තමේන්තු (රු.මිලියන) | ලංසු ඇපකරය (රුපියල් වලින්) |
|---|---|---|---|---|
| LK - ESCAMP - PMU - 144716 - CW - RFB | නව පරිපාලන කාර්ය මණ්ඩල නවාතැන් (ගොඩනැගිලි 3 ක්) ක්‍රීඩාපිටිය සහ මාර්ග ජාලය ඉදිකිරීම (ශ්‍රී ලංකා වන විද්‍යායතනය) - SLFI - නුවරඑළිය - (P5) | ඇඳීම් (Drawings), පිරිවිතර, පරිසර කලමනාකරණ සැලසුම් සහ ප්‍රමාණ පත්වල විස්තර කොට ඇති පරිදි යාන්ත්‍රික සහ විදුලි කර්මාන්ත ඇතුළුව පරිපාලන කාර්ය මණ්ඩල නවාතැන් (ගොඩනැගිලි 3 ක්), ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩාගාරය, ප්‍රධාන ගේට්ටුව සහ ආරක්ෂක කාමරය, මාර්ගය ජාලය ඉදිකිරීම | 213 | 2,130,000.00 |
| LK - ESCAMP - PMU - 144720 - CW - RFB | නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩල නවාතැන් සහ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීම (ශ්‍රී ලංකා වන විද්‍යායතනය) SLFI - නුවරඑළිය (P6) | ඇඳීම් (Drawings), පිරිවිතර, පරිසර කලමනාකරණ සැලසුම් සහ ප්‍රමාණ පත්වල විස්තර කොට ඇති පරිදි යාන්ත්‍රික සහ විදුලි කර්මාන්ත ඇතුළුව නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩල නවාතැන් සහ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීම | 217 | 2,170,000.00 |

3. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
   - කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන් සපුරා තිබිය යුතුය.
   - ලංසුකරු සතුව ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේ වලංගු CIDA ලියාපදිංචියක් (කලින් ICTAD ලියාපදිංචිය) තිබිය යුතු අතර එය සී3 හෝ ඉහළ ශ්‍රේණියක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂතාවය සඳහා විය යුතු අතර ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී එවැනි ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
   - පසුගිය වසර පහ තුළ ඉටු කරන ලද ඉදිකිරීම්වල වාර්ෂික ධාරිතාවයේ සාමාන්‍යය අවම වශයෙන් රු. මිලියන 430ක් විය යුතුය.
   - මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදුකරන ලද යම් අත්තිකාරම් ගෙවීම් හැර, තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ/හෝ ව්‍යාපෘතියට විශේෂිත වූ ණය පහසුකම් රු. මිලියන 72කට අඩු නොවිය යුතුයි.
   - ලංසුකරුවන්ට ලබා දී ඇති උපදෙස් සහ එක් එක් ලංසු ලිපි ලේඛනවලට අදාල කොන්ත්‍රාත් කොන්දේසිවල සඳහන් අවශ්‍ය මූල්‍යමය, තාක්ෂණික සහ පාරිසරික සහ සමාජීය, සෞඛ්‍යමය සහ සුරක්ෂිතතා කළමනාකරණ හැකියාවන් තමන් සතු බව තහවුරු කළ යුතු බව ලංසුකරුවන්ට අවවාද කරනු ලැබේ.
   - පසුගිය වසර තුන තුළ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හෝ නුවරඑළියට සමාන කාලගුණික තත්ත්වයක් ඇති ඕනෑම පෙදෙසක සමාන ස්වභාවයේ කර්මාන්ත පිළිබඳ පළපුරුද්ද.

4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු 2020.06.03 වැනි දින දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර රාජකාරී වේලාව තුළදී බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82, "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශය වෙතින් ලබා ගත හැකිය. සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී ඉහත ලිපිනයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැකිය. (දුරකථන අංක : 0012888426 / 0112888427).

5. එක් එක් ලංසුව සඳහා රු.45,000/- ක ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2020.05.12 වැනි දින සිට 2020.06.03 වැනි දින දක්වා පෙ.ව. 9.00 සහ 3.00 අතර බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82, "සම්පත්පාය", පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලිඛිත අයදුම්පතක් සමග වලංගු CIDA ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීමෙන් මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම්, පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගණකාධිකාරී වෙත මුදලින් සිදුකළ යුතුය.

6. පිටපත් දෙකකින් යුත් සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස සඳහන් කරන ලද වෙන් වෙන් වශයෙන් වූ කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක නැවත තනි කවරයක බහා එහි ඉහළ කෙළවරේ කොන්ත්‍රාත් අංකය සහ ඉදිකිරීමේ ශීර්ෂය සඳහන් කොට 2020.06.04 වැනි දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවීමට බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82, "සම්පත්පාය", පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමණාකරණ ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම ස්ථානයේදී එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

7. 2020.05.21 වැනි දින පෙ.ව. 9.30 ට වැඩබිම් සංචාරය සහ පරීක්ෂාකර බැලීම සිදු කළ හැකිය. එදින, එනම් 2020.05.21 වැනි දින පෙ.ව. 9.30 ට නුවරඑළිය, වන විද්‍යායතන පරිශ්‍රයේදී පූර්ව ලංසු රැස්වීම පැවැත්වේ.

8. ලංසු, 2020.10.30 වැනි දින දක්වා වලංගු විය යුතුය.

9. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරයේ වටිනාකම ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ලිපිලේඛනයට අමුණා ඇති ආකෘතියේ පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් විය යුතුය. ලංසු ඇපකරය, 2020.11.30 වැනි දින දක්වා වලංගු විය යුතුය. වලංගු ලංසු ඇපකරයක් අමුණා එවා නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ලංසුකරුවන් තමන්ගේ ලංසු සමග PCA3 ආකෘතිය (1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත) ඉදිරිපත් කළ යුතුය. **(http://www.drc.gov.lk/)**

11. වැඩබිම් සංචාර සම්බන්ධයෙන් වන පිරිවැය සහ වියදම් ඇතුළුව ලංසු පිළියෙල කිරීම හෝ ගෙනැවිත් භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන්ට දරන්නට සිදුවන ඕනෑම පිරිවැයක් හෝ වියදමක් පිළිබඳව සේවා යෝජකයා වගකියනු නොලැබේ.

12. ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර මෙම ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව (PPC),**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**පරිසර පද්ධතිය සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය,**
**"සම්පත්පාය", අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**දුරකථනය : 0112888426 / 0112888427**

**www.escamp.lk**

2020 මැයි 11 වැනි දින.